# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1767/13 - 2012 ජූලි මස 18 වැනි බදාදා - 2012.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

තිසා/ත7/එල්ඒ/1664

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තිය අනුව, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යවරයා වන මා විසින්, 2011 ජුනි මස 06 දිනැති හා අංක 1709/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 4 A පිටුවේ අංක 06-433 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ඉඩමේ නම ප්‍රමාදයකින් බතලවත්ත, රදාවත්ත, දෙහිගහවත්ත, රංවල බාලඑතනගෙ අරඹ යනුවෙන් සඳහන් වූවත් එය තිප්පොලේවත්ත, විජේහින්ගෙවත්ත, දොඹගහවත්ත ලෙස නිවැරදි විය යුතු බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 ජූලි මස 09 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/907.

08-63

---

එල්ඒ/1918

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, ආසියානු සංවර්ධන බැංකු ආධාර 5 ව්‍යාපෘතිය යටතේ වවුනියාව ජල සම්පාදන ක්‍රමයේ රාණිමිල් ප්‍රදේශයේ තුළුමං ළිඳ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 ජූලි මස 09 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/971.

1A - G 16327 — 355 (2012/07)

**උපලේඛනය**

වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රම්බයිකුලම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රම්බයිකුලම් (රාණිමිල් පෙදෙස) ගමේ පිහිටි වැව රක්ෂිතය නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.016ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:–

| | | |
|---|---|---|
| *උතුරට* | : | වැවු රක්ෂිතය ; |
| *නැගෙනහිරට* | : | වැවු රක්ෂිතය ; |
| *දකුණට* | : | වැවු රක්ෂිතය ; |
| *බටහිරට* | : | වැවු රක්ෂිතය. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :* 01. ජයන්ති පොන්නයියා මිය හා
නිමලන් පොන්නයියා මයා,
ඇටර්නි බලකරු,
එස්. කේ. කනගලිංගම් මයා,
අංක 23/105, ගුඩ්ෂෙඩ් පාර,
වවුනියාව.

08-64

---

එල්ජී/1872

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට කළුතර ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රම අදියර III යටතේ දොඩන්ගොඩ භූගත ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 ජූලි මස 09 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/972.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 800E ග්‍රාම නිලධාරි වසමේ තුඩුගල ගමේ පිහිටි සිල්වර්ඩේල් වත්ත නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු එම්. ජී. නසූර් මහතා විසින් පිළියෙල කර ඇති අංක 275 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.07673 (පර්චස් 30.34)ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | කොන්ක්‍රීට් මාර්ගය ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. සභාපති,
ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

08-65

එල්ජී/1940

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල පවිත්‍රාගාරය හා නිල නිවාස ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 ජූලි මස 09 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/973.

**උපලේඛනය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරිය වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 136, වැදිවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බුරුතකන්ද ගමේ වැදිගමවැව ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු එම්. ජී. නසූර් මහතා විසින් පිළියෙල කර ඇති අංක 274 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.15461 (රූඩ් 01, පර්චස් 21.13)ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ-

| | | |
|---|---|---|
| *උතුරට* | : | ආර්. පී. හැරිස් මහතා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | හම්බන්තොට සිට සූරියවැවට යන මහා මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ඃ* 01. ආර්. පී. හැරිස් මහතා
සූරියවැව.

08-66

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.